අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු (නව නිර්දේශය)

**General Certificate of Education (Adv. Level) Examination, August 2014 (New Syllabus)**

බෞද්ධ ශිෂ්ටාචාරය **I** / පැය දෙකයි

**Buddhist Civilization I / Two hours**

උපදෙස්:
- **සියලු ම** ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ උත්තරය තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. වෛදික ඉගැන්වීම් අනුව විශ්වය හා සත්ත්වයා මවන ලද්දේ සර්ව බලධාරී මහාබ්‍රහ්මයා විසිනි. මිනිසා හා මහාබ්‍රහ්මයා අතර සම්බන්ධය තහවුරු කිරීමෙහි ලා ඔවුන් උපයෝගී කරගත් සංකල්පයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) භූත බලය පිළිබඳ ඉගැන්වීමයි.
(2) විශ්ව බලය පිළිබඳ ඉගැන්වීමයි.
(3) කාය බලය පිළිබඳ ඉගැන්වීමයි.
(4) ආත්ම බලය පිළිබඳ ඉගැන්වීමයි.
(5) ධර්ම බලය පිළිබඳ ඉගැන්වීමයි.

02. සමාජයේ විවිධත්වය හා ඒකත්වය පවත්වා ගෙන යාම සඳහා මනුෂ්‍ය වර්ගයා වර්ණ හතරකට බෙදා මැවූ බව වේද ග්‍රන්ථවල දක්වේ. මෙම ඉගැන්වීම් බ්‍රාහ්මණයන් විසින් විවිධ අභිප්‍රායයන් ඉෂ්ට කර ගැනීම සඳහා යොදා ගත් බව පෙනේ. ඒ අනුව පහත දක්වෙන කරුණු අතුරෙන් ඔවුන්ගේ ප්‍රධාන අභිමතාර්ථය වූයේ,
(1) ආර්ථික අයිතිය රැක ගැනීමයි.
(2) දේශපාලන අයිතිය රැක ගැනීමයි.
(3) ඉඩම් අයිතිය රැක ගැනීමයි.
(4) අධ්‍යාපන අයිතිය රැක ගැනීමයි.
(5) පූජක අයිතිය රැක ගැනීමයි.

03. බ්‍රාහ්මණ ජීවන චර්යාවන්ට අයත් කාර්යාවලිය හා කාර්ය නියමයන් බ්‍රාහ්මණ ඉගැන්වීම්වල පැහැදිලි ව දක්වා තිබේ. එහි ලා බ්‍රාහ්මණ ගෘහපතියා සහ බ්‍රාහ්මණ පූජකයා අතර අසමානතා දක්වෙයි. එහෙත් මේ දෙපිරිසට ම පොදුවූත්, අනිවාර්යවූත් කාර්යභාරයක් වූයේ,
(1) බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමයි.
(2) වේද අධ්‍යාපනයයි.
(3) කාමයෙහි ආශක්ත නොවීමයි.
(4) වෙළඳාම් කිරීමයි.
(5) කෘෂිකර්මාන්තයේ යෙදීමයි.

04. මිනිසකුගේ උත්පත්තිය සමග ඔහුට නියම වන රාජකාරියක් මැවුම්කරුවා විසින් නියම කොට ඇති බව වේදයෙහි දක් වේ. ස්වකීය ඥාතීන් ඝාතනය කිරීමට මැලි වූ අර්ජුන රජු ඉදිරියේ ශ්‍රී කෘෂ්ණ පෙනී සිටිමින් 'යුද්ධය කරන්න'යි පෙලඹ වූ ආකාරය භගවත්ගීතාවේ පැහැදිලි ව දක් වේ. මෙසේ ඵල අපේක්ෂාවකින් තොරව තමන් වෙත පැවැරෙන රාජකාරිය ඉටුකළ යුතු බව දක්වෙන ඉගැන්වීම හඳුන්වන්නේ,
(1) වර්ණ ධර්ම නමිනි.
(2) ආශ්‍රම ධර්ම නමිනි.
(3) ස්වධර්ම නමිනි.
(4) ආපද් ධර්ම නමිනි.
(5) රාජ්‍ය ධර්ම නමිනි.

05. බුද්ධ කාලීන භාරතීය ආගමික නායකයන් අතර ෂට් ශාස්තෘවරු කැපී පෙනෙන පිරිසක් ලෙස හඳුනාගත හැකි ය. ඔවුන්ගෙන් ඇතමෙක් ආගමික විප්ලවයකට මඟ පෙන්වීමට ක්‍රියා කළ අතර අලසකමට මිනිසුන් යොමු කර වූ අය ද මොවුනතර වූහ. නාස්තිකවාදී චින්තනය තවත් සමහරකුගේ ජනප්‍රිය ඉගැන්වීම විය. අන්තගාමී ව සැප විඳීමත්, අන්තගාමී ව දුක් විඳීමත් තවත් සමහරකුගේ ප්‍රතිපත්තිය විය. ඔවුන් අතර උච්ඡේදවාදී භෞතික චින්තනයක් ඉගැන් වූ ශාස්තෘවරයා වූයේ,
(1) පූර්ණ කස්සප ය.
(2) අජිත කේසකම්බල ය.
(3) පකුධ කච්චායන ය.
(4) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.
(5) මක්ඛලීගෝසාල ය.

06. භාරතයේ ව්‍යාප්ත ව තිබූ, බ්‍රාහ්මණ සංස්කෘතියට එරෙහි බලවේගයක් ගොඩනැගීමෙහි ප්‍රමුඛ වූවෝ ශ්‍රමණයෝ ය. එහි ලා ෂට් ශාස්තෘවරු සුවිශේෂ වෙති. ප්‍රධාන වශයෙන් බ්‍රාහ්මණ සම්ප්‍රදායානුගත ඉගැන්වීම් හා ගැටුන ඔවුහු තම තමන් අතර ද මතවාදී වශයෙන් සමානත්වයක් ඇතැයි නො පිළිගත්හ. එහෙත් පොදු වශයෙන් ෂට් ශාස්තෘවරුන් ප්‍රතික්ෂේප කළ ඉගැන්වීමක් ලෙස ප්‍රකට ව ඇත්තේ,
(1) අකිරියවාදයයි.
(2) නිර්මාණවාදයයි.
(3) උච්ඡේදවාදයයි.
(4) ශාස්වතවාදයයි.
(5) පුබ්බේකතහේතුවාදයයි.

EXAMMOOD.LK

07. වෛදික චින්තනය තුළ කාන්තාවට ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජික වශයෙන් අයිතිවාසිකම් අහිමිවූවා පමණක් නොව ඇය බුද්ධියෙන් හීන සමාජයීය වශයෙන් පහත් තැනැත්තියක් ලෙස ද සලකන ලදී. එහෙත් බුදුසමය කාන්තාවට යථෝක්ත සියලු අයිතිවාසිකම් ලබා දී කාන්තාව ද පුරුෂයා මෙන් ප්‍රඥාවන්ත තැනැත්තියක් බව තහවුරු කෙළේ ය. මේ බව මනාව ප්‍රකට වන්නේ, කාන්තාවට ද,
(1) පැවිදි වීමට අවසර ලබා දීමෙනි.
(2) දහම් ඇසීමට අවසර ලබා දීමෙනි.
(3) උපසපන් වීමට අවසර ලබා දීමෙනි.
(4) ධර්ම දේශනා කිරීමට අවසර ලබා දීමෙනි.
(5) තනතුරු ප්‍රදානය කිරීමෙනි.

08. විශ්වය හා සත්ත්වයා දේව නිර්මාණයක් යැ'යි වෛදික ග්‍රන්ථවල උගන්වන නමුත් බුදුසමයෙහි දක්වෙන්නේ එය ක්‍රමික පරිණාමයක ප්‍රතිඵලයක් ලෙසයි. මෙම අදහස මක්ඛලීගෝසාලගේ පරිණාමවාදයට ද සමාන නො වේ. බෞද්ධ ඉගැන්වීම අනුව අප ජීවත්වන්නේ නොනවතින පරිණාමයකට අයත් ලෝකයකයි. මේ අනුව බෞද්ධ පරිණාමවාදී චින්තනයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ, පරිණාමය,
(1) අහේතුකව සිදු වන බව ය.
(2) දේව කැමැත්ත අනුව සිදු වන බව ය.
(3) භෞතික නියතිය මත සිදු වන බව ය.
(4) හේතු ප්‍රත්‍ය නිසා සිදු වන බව ය.
(5) කාලගුණ, දේශගුණ විපර්යාස නිසා සිදු වන බව ය.

09. ක්‍රි.පූ. හයවන සියවස වනවිට භාරතය දේශපාලනික වශයෙන් ජනපද දහසයකට බෙදී වෙන් වී පැවැති බවත් ඒවායෙහි රාජාණ්ඩු හතරක් ද, ගණතන්ත්‍ර සමූහාණ්ඩු දෙකක් ද පැවැති බවත් සඳහන් වේ. බෞද්ධ සැදැහැවතුන් විසින් දක වැඳ පුදා සංවේගය පහළ කර ගතයුතු බුද්ධ චරිතයේ අනුස්මරණීය සිදුවීම් හතරින් දෙකක් සිදු වී ඇත්තේ මෙහි එක් රාජ්‍ය සීමාවක් තුළ ය. එම රාජ්‍යය වන්නේ,
(1) මගධ රාජ්‍යයයි.
(2) වජ්ජි රාජ්‍යයයි.
(3) වත්ස රාජ්‍යයයි.
(4) මල්ල රාජ්‍යයයි.
(5) කෝසල රාජ්‍යයයි.

10. චක්කවත්තිසීහනාද සූත්‍රයේ දක්වෙන පරිදි සමාජය තුළ හේතුඵල වශයෙන් පාප ක්‍රියා සන්තතියක් වර්ධනය විය. එබඳු අපගාමී චර්යා පද්ධතියක් වෙත සමාජය යොමු වීමට ඉවහල් වූ ප්‍රධාන සාධකය වූයේ,
(1) කාමාශාවයි.
(2) අභිධ්‍යාවයි.
(3) දරිද්‍රතාවයි.
(4) මහිච්ඡතාවයි.
(5) සම්පත් බෙදීයාමේ අක්‍රමිකතාවයි.

11. බෞද්ධ පැවිද්ද ආරම්භ වන්නේ පස්වග මහණුන් පැවිදි උපසම්පදා කිරීමෙනි. මෙසේ ආරම්භ වූ පැවිදි උපසම්පදා කිරීම කාලීන ව ඇති වූ ගැටලුවලට සපයන ලද විසඳුම් ඔස්සේ ක්‍රමික ව විකාශයට පත් වූ බව මහාවග්ගපාළියෙන් තහවුරු වේ. ඒ අනුව "ඒහි භික්ඛු" භාවයෙන් සිදු කළ පැවිදි උපසම්පදා ක්‍රමය වෙනුවට "තීහි සරණාගමන" පැවිදි උපසම්පදා ක්‍රමය භාවිතයට පැමිණ ඇත්තේ,
(1) පැවිදි උපසම්පදා කිරීමේ ක්‍රමය සරල කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) පැවිද්ද බොහෝ පිරිසකට ප්‍රදානය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(3) බුදුරදුන් වෙත පැවැති කාර්යභාරය භික්ෂූන් වෙත පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(4) බුදුසමය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.
(5) මහජන ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

12. ගිජ්ඣකූටය යනු බෞද්ධ සාහිත්‍යයේ දක්වෙන වැදගත් පූජනීය ස්ථානයකි. බුදුරජාණන් වහන්සේ ගිජ්ඣකූට පර්වතයේ දී සූත්‍ර ගණනාවක් දේශනා කොට ඇත. මෙහි පර්වතය පිහිටා ඇත්තේ එවකට පැවැති,
(1) වජ්ජි රාජ්‍යයේ ය.
(2) කෝසල රාජ්‍යයේ ය.
(3) මගධ රාජ්‍යයේ ය.
(4) මල්ල රාජ්‍යයේ ය.
(5) අවන්ති රාජ්‍යයේ ය.

13. "ඒකාන්තයෙන් මම තරණය කෙළෙම් තරණය කරවන්නට, මිදුනෙම් මුදවන්නට, දැමුණෙම් දමනය කරවන්නට ශාන්ත වූයෙම් ශාන්ත කරවන්නට, අස්වැසුනෙම් අස්වසවන්නට, පිරිනිවියෙම් පිරිනිවාලන්නට සමත්වෙමි'යි බුදුරදුන් තුළ පැවැති මෙකී ආකල්පයෙන් ප්‍රකට වන්නේ,
(1) මහාකරුණා ගුණයයි.
(2) තාදී ගුණයයි.
(3) විශිෂ්ඨ ශාස්තෘත්වයයි.
(4) පද්මාකාර ජීවිතයයි.
(5) මහාප්‍රඥා ගුණයයි.

14. "මහණ මෙහි එන්න. ධර්මය මොනවට දෙසන ලදී. මනා කොට දුක් කෙළවර කිරීම පිණිස බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්න." යන බුදුරදුන්ගේ ආමන්ත්‍රණයකින් ප්‍රදානය කරන ලද උපසම්පදාව රාධ බමුණා උපසපන් කිරීමේ දී සංස්කරණය විය. ඉන් අනතුරුව භාවිතයට පැමිණියේ,
(1) ඕවාදපටිග්ගහණ උපසම්පදා ක්‍රමයයි.
(2) තීහි සරණාගමන උපසම්පදා ක්‍රමයයි.
(3) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදා ක්‍රමයයි.
(4) පඤ්හව්‍යාකරණ උපසම්පදා ක්‍රමයයි.
(5) අට්ඨවාචික උපසම්පදා ක්‍රමයයි.

EXAMMOOD.LK

15. එකල්හි ඇතැම් සාමණේරයෝ භික්ෂූන් කෙරෙහි ගෞරව නැත්තෝ, යටහත් පැවැතුම් නැත්තෝ, ගැළපෙන පැවැතුම් නැත්තෝ ව වෙසෙති. මේ බව දත් බුදුරජාණන් වහන්සේ කරුණු පහකින් යුත් සාමණේර භික්ෂූන්ට දඬුවම් දීමට නියම කළහ. එහි ලා දඬුවම් ලැබීමට අදාළ අශ්‍රාමණික පැවතුමක් ලෙස සඳහන් ව ඇත්තේ,
(1) කුල දූෂණය සඳහා පෙළඹවීමයි.
(2) ආක්‍රොෂ පරිභව කිරීමයි.
(3) ගරු නො කිරීමයි.
(4) සංඝයා භේද කිරීමයි.
(5) බොරු චෝදනා එල්ල කිරීමයි.

16. "රාජ භටයන් පැවිදි නො කළ යුතු ය." යන සීමා නියමය පනවන ලද්දේ,
(1) බිම්බිසාර රජුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(2) කොසොල් රජුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(3) අජාසත්ත රජුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(4) සුද්ධෝදන රජුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.
(5) උදේන රජුගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙනි.

17. බුදුරජාණන් වහන්සේ ප්‍රථම රහත් හැටනම සමඟ ආරම්භ කළ බෞද්ධ ධර්ම දූත සේවාව හේතුවෙන් බුද්ධ කාලයේ දී ම භාරතයේ නොයෙක් ප්‍රදේශවල බුදු දහම ව්‍යාප්ත වී ගිය අයුරු ශාසන ඉතිහාසයෙන් පැහැදිලි වේ. මෙසේ ධර්ම ප්‍රචාරක කටයුතු මැනවින් ඉටු කළ ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිළිබඳ තොරතුරු මහාවග්ගපාළි වැනි මූලාශ්‍රයවල දක් වේ. එසේ බුද්ධකාලීන ව ධර්ම ප්‍රචාරයේ ප්‍රමුඛ කාර්යයන් ඉටු කළ තෙර නමක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) බක්කුල තෙරුන් ය.
(2) අංගුලිමාල තෙරුන් ය.
(3) අස්සජි තෙරුන් ය.
(4) මන්තානිපුත්ත පුණ්ණ තෙරුන් ය.
(5) චක්ඛුපාල තෙරුන් ය.

18. බුද්ධ ශ්‍රාවක සංඝ සමාජය භික්ෂු සංඝ, භික්ෂුණී සංඝ, උභතො සංඝ, සේඛ සංඝ, අසේඛ සංඝ, සම්මුති සංඝ යනුවෙන් කොටස් රැසකින් සමන්විත විය. මේ අතුරෙන් "අට්ඨපුරිස පුග්ගලා" යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) භික්ඛු සංඝ කොටසයි.
(2) උභතෝ සංඝ කොටසයි.
(3) සම්මුති සංඝ කොටසයි.
(4) සේඛ සංඝ කොටසයි.
(5) ශ්‍රාවක සංඝ කොටසයි.

19. ඉරුදින දහම් පාසල් සමිතියේ දී සිසුවකු විසින් කරන ලද කතාවකින් කොටසක් පහත දැක්වේ.
"දහම් පාසල් දරුවන් වන අප පස් පව්වලින් වැළකෙන්න ඕන. පිං පව්, කුසල් අකුසල්වල ඵලවිපාක දන්න අය විදිහට පිං සහ කුසල් ලෙස හඳුන්වන යහපත් දේ පමණක් කරන්න ඕන. පව්, අකුසල් නමින් හැඳින්වෙන අයහපත් දේ කරන්න ලැජ්ජා වෙන්න ඕන. භය වෙන්නත් ඕන. ලැජ්ජාව සහ භය කියන්නේ බෞද්ධයකු තුළ අවශ්‍යයෙන් ම පිහිටිය යුතු ගුණ ධර්ම දෙකක්. මේවාට හිරි-ඔතප් කියලත් කියනවා. දේව ධර්ම නමිනුත් හැඳින්වෙනවා. ලැජ්ජා භය ඇතිව හැදුනම කරුණාව, මෛත්‍රිය, දානය, පරිත්‍යාගය, නම්‍යශීලීතාව වැනි සත්ගුණ වැඩි වැඩියෙන් ජීවිතයට ඇතුළු වෙනවා" මෙම ඡේදයෙන් කියැවෙන මුඛ්‍ය අදහස වන්නේ,
(1) දහම් පාසල් අධ්‍යාපනයේ වැදගත්කමයි.
(2) පස්පව්වලින් වැළකිය යුතු බවයි.
(3) පිං පව් කුසල් අකුසල් පිළිබඳ අවබෝධයයි.
(4) දේව ධර්මයේ උපයෝගීතාවයි.
(5) ලැජ්ජා භය ඇත්නම් පව් පිං නො කරන බවයි.

20. ආචාර ධර්ම පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව ඇතැම් සදාචාරමය ක්‍රියා ඍජුව පුද්ගලානුබද්ධ ය. ඇතැම් ක්‍රියා ඍජුව සමාජානුබද්ධ ය. ඇතැම් ක්‍රියා පුද්ගලානුබද්ධ මෙන් ම සමාජානුබද්ධ ය. මෙවැනි ආචාර ධර්ම අත්තහිත-පරහිත නමින් හැඳින්වෙන යහපත් ක්‍රියා ලෙස බුදුසමය අගය කරයි. මේ අනුව තමාගේ මෙන් ම සමාජයේ සුරක්ෂිතතාව පිණිස ඍජුව ඉවහල් වන සදාචාරමය ක්‍රියා ලෙස හඳුනාගත හැක්කේ,
(1) පන්සිල් සුරැකීමයි.
(2) දන්දීමයි.
(3) ඒදඬු පාලම් ඉදිකිරීමයි.
(4) විදර්ශනා වැඩීමයි.
(5) ළිං පොකුණු තැනීමයි.

21. හොඳ-නරක තීරණය කිරීමේ දී තීරණායක ලෙස භාවිත කොට ගත හැකි ධර්ම උපදේශයක් 'ආධිපතෙය්‍ය' ධර්ම නමින් අංගුත්තර නිකායේ දක් වේ. ආධිපතෙය්‍ය යනු අධිපති කොට හෙවත් කේන්ද්‍ර කොට කල්පනා කිරීම ය. ඒ අනුව ක්‍රියාවක් කිරීමට පෙර එම ක්‍රියාවේ යුක්ති යුක්තතාව පරීක්ෂා කළ යුතු වේ. මෙකී ආධිපතෙය්‍ය ධර්මවලට අනුව වඩාත් යහපත් ක්‍රියාවක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) තමාට සුදුසු යැ'යි හැඟෙන ක්‍රියාවයි.
(2) සමාජ මතයට අනුරූප වන ක්‍රියාවයි.
(3) තමාට හා සමාජ මතයට අනුරූප වන ක්‍රියාවයි.
(4) තම හෘදසාක්ෂියට, සමාජ මතයට හා ධර්මයට අනුගත ක්‍රියාවයි.
(5) තමාට හා අන්‍යයන්ට හිතකර වන ක්‍රියාවයි.

EXAMMOOD.LK

22. සචේතනික ව කරනු ලබන හොඳ-නරක ක්‍රියාවන්ගේ විපාකය කතෘ වෙත පැවරීමට නම් එම ක්‍රියාව කිරීම පිණිස ඔහුට,
(1) ස්වච්ඡන්දතාවක් තිබිය යුතු ය.
(2) වගකීමක් තිබිය යුතු ය.
(3) ආශාවක් තිබිය යුතු ය.
(4) චේතනාවක් තිබිය යුතු ය.
(5) විශ්වාසයක් තිබිය යුතු ය.

23. "පුඤ්ඤ" "කුසල" යන පද දෙක බෞද්ධ ආචාර ධර්ම ක්ෂේත්‍රය තුළ ඉතා වැදගත් යෙදුම් ලෙස හැඳින්විය හැකි ය. සාමාන්‍යයෙන් මෙම පද දෙකෙන් හොඳ, සාධු, කරණීය, සංඛ්‍යාවට ගැනෙන සදාචාරමය ක්‍රියා හැඳින්වෙන බව ද, පද දෙක ම සමානාර්ථයෙන් භාවිත වන බව ද පෙනේ. එහෙත් ධර්මානුකූල ව සැලකිල්ලට ගත් විට මෙම පද දෙක අතර ඉතා වැදගත් වෙනසක් පවත්නා බව දක්නට ලැබේ. ඒ අනුව පුඤ්ඤ හෙවත් පින ලෞකික සැප විපාක වැඩි කරන සාංසාරික ප්‍රවෘත්තිය යහපත් කරන සදාචාරාත්මක ක්‍රියාවක් වන අතර කුසලය රාග, ද්වේෂ, මෝහ අඩු කරන සාංසාරික නිවෘත්තිය හෙවත් නිවන වෙත සත්ත්වයා පමුණුවන ආචාර ධර්මයක් බව සනාථ වේ. මේ අනුව නිර්වාණයට සත්ත්වයා ඍජු ව යොමු කරන කුසල ධර්මයක් ලෙස හැඳින්විය හැක්කේ,
(1) නිති පන්සිල් රැකීමයි.
(2) මහසඟරුවන විෂයයෙහි දන් පිළිගැන්වීමයි.
(3) සියලු සත්ත්වයන්ට මෙත් වැඩීමයි.
(4) තිලකුණු මෙනෙහි කොට විදසුන් වැඩීමයි.
(5) තෙරුවන් ගුණ භාවනාවයි.

24. කුසල්-අකුසල් වර්ග කිරීමේ දී කායික, වාචසික, මානසික වශයෙන් ද්වාරත්‍රයෙන් ම පුද්ගලයා විසින් කුසලාකුසල ක්‍රියා සිදු කරනු ලබන බව බෞද්ධ ඉගැන්වීම ය. ඒ අනුව දසකුසල ධර්මවල එන මිච්ඡා දිට්ඨියෙන් බැහැර වීම,
(1) කායික කුසලයකි.
(2) වාචසික කුසලයකි.
(3) මානසික කුසලයකි.
(4) මානසික හා කායික කුසලයකි.
(5) කායික මෙන් ම වාචසික කුසලයකි.

25. එදින විහාරස්ථානයට හතර පේරුවේ දායක දායිකාවන් රැස්වූයේ අපවත් වී වදාළ ලොකු හාමුදුරුවන් වහන්සේගේ තෙමස් පූර්ණ දානමය පිංකමට සහභාගිවීමටයි. පන්සිල් සමාදන් කරවා බුද්ධ පූජාව සිදු කළ ස්වාමීන් වහන්සේ සැදැහැතියන් ලවා මොහොතක් මෛත්‍රී භාවනා කරවීමට ද අමතක නො කළ හ. සඟරුවන විෂයයෙහි දැක්විය යුතු ගෞරව සත්කාර සම්මාන මෙන් ම වතාවත් සිදු කොට සැදැහැතියන් විසින් දන් පිළිගන්වන ලදී. දන් වළදා අවසානයේ එක් හිමිනමක් සාරවත් භුක්තානුමෝදනා දේශනයක් සිදු කළ අතර, ඊට සවන් දුන් සියලු දෙනාගේ මනස ධර්මානුකූල මාවතකට යොමු කොට පිං-පව්, කුසල්-අකුසල් පිළිබඳ, දැක්මක් ඇති කර ගැනීමට එමගින් හැකි විය. අනතුරුව පැන් වඩා, ලොකු හාමුදුරුවන් වහන්සේට පිං පැමිණ වූ අතර, පැමිණි සියලු දෙනා ම "සාධු සාධු" යයි පිං අනුමෝදන්ව පිංකම හමාර කළහ. ඉහත සිදුවීම් මාලාවෙහි දස පිං කිරියවත් තුළ උගත් වන පිංකම්වලින්,
(1) හයක් ඇතුළත් වේ.
(2) හතක් ඇතුළත් වේ.
(3) අටක් ඇතුළත් වේ.
(4) නවයක් ඇතුළත් වේ.
(5) දහයම ඇතුළත් වේ.

26. උයන්වතු වැවීම මෙන් ම වන වගාව ද උසස් පිංකම් ලෙස බුදුසමය අගය කරයි. එසේ ම ඒදඬු පාලම් තැනීම හා නිවාසස්ථාන තැනීම ද එවැනි ම උතුම් පිංකම් ලෙස සැලකේ. ළිං පොකුණු තැනීම හා පානීය ජල පහසුකම් සැපයීම ද සත්ත්ව හා ශාඛ ප්‍රජාවේ යහපැවැත්මට ඉවහල් වන හෙයින් ඒවා ද උතුම් පිංකම් ලෙස සංයුක්ත නිකායේ වනරෝප සූත්‍රයේ දැක්වේ. දිවා රෑ පිං වැඩෙන මෙවැනි උතුම් පිංකම් සමාජයේ යහපැවැත්ම උදෙසා බෙහෙවින් උපකාරී වේ. තව ද ගස්, වැල් හා බීජ සිඳීම, ජලයේ හෝ විවෘත පරිසරයේ හෝ මල මුත්‍රා කිරීම, කෙළ ගැසීම ආදිය සිදු නොකළ යුතු බව විනය නීති රීති මගින් පවා අවධාරණය කොට ඇත. මෙම සමස්ත ඡේදයේ අන්තර්ගතයෙන් ප්‍රකට වන්නේ,
(1) වන වගාව බුදුසසුනේ උසස් ලෙස වර්ණනා කොට ඇති බවයි.
(2) ජල කළමනාකරණය හා සංරක්ෂණය උසස් පිංකමක් වන බවයි.
(3) පරාර්ථයට හේතු වන සමාජ සත්කාර නිර්වාණගාමී මාර්ගය වන බවයි.
(4) පරිසර සංරක්ෂණය ඉහළින් අගය කොට ඇති බවයි.
(5) ස්වභාව සෞන්දර්ය අගය කොට ඇති බවයි.

27. කළමනාකරණය පිළිබඳ විවිධ නිර්වචන දක්නට ලැබේ. පොදු වශයෙන් කිසියම් සංවිධානයක හෝ පුද්ගලයකුගේ හෝ ඵලදායිතාව වර්ධනය කිරීමේ ක්‍රමවේදයක් කළමනාකරණය යන්නෙන් අදහස් වෙයි. මෙකී අරුතින් බෞද්ධ සන්දර්භය තුළ ද කළමනාකරණය යන්න භාවිත වන බව දැකිය හැකි ය. භෞතික සම්පත් හා මානව සම්පත් කළමනාකරණයේ දී ගිහි පැවිදි උභය පක්ෂයට පොදුවූත්, මූලික පරමාර්ථ සාධනයෙහි ලා ප්‍රමුඛවූත් කළමනාකාරිත්වයක් ලෙස අවධාරණය කොට ඇත්තේ,
(1) සම්පත් කළමනාකරණයයි.
(2) ආධ්‍යාත්මික කළමනාකරණයයි.
(3) සිරිත් කළමනාකරණයයි.
(4) නිෂ්පාදන කළමනාකරණයයි.

EXAMMOOD.LK

28. යම් මිනිසෙක් නින්දෙහි ඇලුනේ වේ ද, පිරිස කෙරෙහි ඇලුනේ වේ ද, උට්ඨාන වීර්යය නැත්තේ ද, උපතින් ම අලස වේ ද, ක්‍රෝධය ලක්ෂණ කොට ඇත්තේ ද ඔහු,
(1) සතර අගතියෙන් අගතිගාමී ව කටයුතු කරන්නෙකි.
(2) පරිහානිය පිළිබඳ නො සිතා කටයුතු කරන්නෙකි.
(3) පරාර්ථචර්යාව නො සලකා කටයුතු කරන්නෙකි.
(4) වසල ධර්ම පිළිබඳ අවබෝධයෙන් තොරව කටයුතු කරන්නෙකි.
(5) පිං-පව් පිළිබඳ අනවබෝධයෙන් කටයුතු කරන්නෙකි.

29. සෞන්දර්ය රසාස්වාදය පිණිස ඉවහල් වන විවිධ මාධ්‍ය දක්නට ලැබේ. ඒවා සොබා දහම, කලාත්මක නිර්මාණ හා පුද්ගල කේන්ද්‍රීය සෞන්දර්ය වශයෙන් හඳුනාගත හැකි ය. බෞද්ධ කලාකරුවෝ නිර්මාණාත්මක සෞන්දර්ය විෂයයෙහි දී මනා ශික්ෂණයකින් හා සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පයෙන් බැහැර නො වී සිය නිර්මාණ ඉදිරිපත් කළහ. බුදුසමයට අනුව නිර්මාණාත්මක සෞන්දර්යය,
(1) ප්‍රසාදය හා විරාගය පිණිස ඉවහල් විය යුතු ය.
(2) ශ්‍රද්ධාව හා භක්තිය පිණිස ඉවහල් විය යුතු ය.
(3) රසාස්වාදය හා විනෝදය පිණිස ඉවහල් විය යුතු ය.
(4) ප්‍රීතිය හා ප්‍රමෝදය පිණිස ඉවහල් විය යුතු ය.
(5) සැපය හා සමාධිය පිණිස ඉවහල් විය යුතු ය.

30. රාජ්‍ය පාලකයකු විසින් දැහැමි රාජ්‍ය පාලනයක් පිණිස උපයෝගී කර ගත යුතු ගුණධර්ම දහයක් ජාතකපාළියේ දක් වේ. ඒවා දසරාජධර්ම නමින් හැඳින් වේ. දසරාජධර්මයෙහි ඇතුළත් ප්‍රථම අංග තුන,
(1) දාන, සීල, භාවනා වේ.
(2) දාන, සීල, නෙක්ඛම්ම වේ.
(3) දාන, සීල, පරිච්චාග වේ.
(4) දාන, සීල, පඤ්ඤා වේ.
(5) දාන, සීල, සමාධි වේ.

31. ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයකු වූ බුදුරජාණන් වහන්සේ නිරතුරුව ම සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ දක්ෂතා අගය කොට තනතුරු ප්‍රදානය කළ බව අංගුත්තර නිකායේ එතදග්ග පාළියෙන් පැහැදිලි වේ. ඒ අනුව ධුතංගධාරීන් අතර අග තනතුර හිමි වූයේ,
(1) මහා කච්චායන හිමියන්ට ය.
(2) මහා කාශ්‍යප හිමියන්ට ය.
(3) ලකුණ්ටක භද්දිය හිමියන්ට ය.
(4) අඤ්ඤාකොණ්ඩඤ්ඤ හිමියන්ට ය.
(5) සැරියුත් හිමියන්ට ය.

32. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු විශාලා මහනුවර වාලුකාරාමයට ඒකරාශී වූ සබ්බකාමී මහරහතන් වහන්සේ ඇතුළු සත්සිය නමක් විසින් දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ බවත්, මෙම ධර්ම සංගායනාවට පෙර විශේෂ කාරක සභාවක් (උබ්බාහිකාවක්) විසින් දසවස්තුව අකැපයයි තීන්දු කළ බවත් චුල්ලවග්ග පාළියේ සත්තසතිකක්ඛන්ධකයේ සඳහන් වේ. එම උබ්බාහිකාවට අයත් වූ භික්ෂූන් වහන්සේලාගේ ගණන වූයේ,
(1) අට නමකි.
(2) දොළොස් නමකි.
(3) විසි නමකි.
(4) පන්සිය නමකි.
(5) හත්සිය නමකි.

33. පැළලුප් නුවර අශෝකාරාමයට ඒකරාශී වූ මොග්ගලීපුත්ත තිස්ස මහ තෙරුන් වහන්සේ ඇතුළු රහතන් වහන්සේලා දහස් නමකගේ සහභාගිත්වයෙන් ධර්මාශෝක රජුගේ අනුග්‍රහය ඇතිව තෙවන ධර්ම සංගායනාව පැවැත් වූ බව මූලාශ්‍රයවල සඳහන් වේ. එම සංගායනාවේ දී ධර්ම විනයේ අනාගත සුරක්ෂිතතාව උදෙසා ගනු ලැබූ ප්‍රමුඛතම පියවරක් ලෙස සැලකිය හැක්කේ,
(1) සමස්ත බුද්ධ වචනය ඒකරාශී කොට භාණක පරම්පරා මගින් පවත්වා ගෙනයාමේ ක්‍රමවේදයක් ඇති කිරීමයි.
(2) සැට දහසක් අන්‍යතීර්ථක භික්ෂුවේශධාරීන් සසුනින් ඉවත් කිරීමයි.
(3) ප්‍රත්‍යන්ත දේශවලට බුදු දහම හඳුන්වා දීමයි.
(4) ධර්මය සෙල් පුවරුවල කොටවා ප්‍රදර්ශනය කිරීමයි.
(5) දිගු කලක් නැවතී තිබූ විනය කර්ම නැවත ආරම්භ කිරීමයි.

34. සුභද්‍ර හිමියන්ගේ ශාසන විරෝධී ප්‍රකාශය ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට බල පෑ ආසන්නතම හේතුව ලෙස සැලකුව ද ඒ සඳහා පදනම් වූ හේතු සාධක සමුදායක් පැවැති බව ශාසන ඉතිහාසයෙන් පැහැදිලි වේ. නිගණ්ඨනාත පුත්තයන්ගේ අභාවයත් සමඟ ඔහුගේ ශිෂ්‍යයන් අතර මතභේද ඇති වී ජෛන ශාසනය දෙකඩ වීම ද ධර්ම සංගායනාවක අවශ්‍යතාව මතු කළ සිදුවීමක් බව දීඝනිකායේ සංගීති සූත්‍රයේ සඳහන් වේ. එම සූත්‍රයට අනුව මෙම සිදුවීම සැලකිල්ලට ගෙන ලෝකයාට හිතසුව පිණිස තථාගත ධර්මය සංගායනා කළ යුතු යැ'යි අනුශාසනා කරන ලද්දේ,
(1) ආනන්ද හිමියන් විසිනි.
(2) මහකාශ්‍යප හිමියන් විසිනි.
(3) චුන්ද හිමියන් විසිනි.
(4) සැරියුත් හිමියන් විසිනි.
(5) [illegible]

EXAMMOOD.LK

35. කීර්තිමත් ම බෞද්ධ විශ්වවිද්‍යාලය වූ නාලන්දා විශ්වවිද්‍යාලයේ විසූ නාගාර්ජුන, ආර්යදේව, හියුංසාං, ශීලභද්‍ර, ශාන්ත රක්ෂිත වැනි සුප්‍රකට ආචාර්යවරුන් අධ්‍යයන-අධ්‍යාපන කාර්යයට අමතර ව ධර්ම ප්‍රචාරක කාර්යයෙහි ද නියැලී තිබේ. ඒ අනුව තිබ්බතයේ ධර්ම ප්‍රචාරය සඳහා වැඩම කළ ආචාර්යයන් වහන්සේ නමක් ලෙස සඳහන් වන්නේ,

(1) නාගාර්ජුන පාදයන් ය. (2) ආර්යදේව තෙරුන් ය. (3) ශීලභද්‍ර තෙරුන් ය.
(4) හියුංසාං තෙරුන් ය. (5) ශාන්ත රක්ෂිත තෙරුන් ය.

36. ප්‍රාග් බෞද්ධ ශ්‍රී ලංකාවේ විවිධ ආගමික ඇදහිලි පැවැති බව මහාවංශය ආදී ඓතිහාසික මූලාශ්‍රයවල සඳහන් වන අතර ඇතැම් පුරාවිද්‍යාත්මක සාධක ද ඊට සාක්ෂි දරයි. මෙම ආගමික විශ්වාස අතර පණ්ඩුකාභය රාජ්‍ය සමයේ දී යකුන් හා යකින්නියන් ඇදහීම ජනප්‍රිය ව පැවැති ආකාරය රජතුමා විසින් නගරයේ ඒ ඒ යකුන් හා යකිනියන්ට දෙවොල් ඉදිකරවා දීම ආදියෙන් පැහැදිලි වේ. මේ අනුව අභය වැවේ පහළ කෙළවරේ දෙවොලක් තනා පුදපූජා පවත් වන ලද්දේ,

(1) වළවාමුඛී යකින්නියට ය. (2) කාලවේල යක්ෂයාට ය. (3) චිත්තරාජ යක්ෂයාට ය.
(4) වෛශ්‍රවණ යක්ෂයාට ය. (5) මහේජ යක්ෂයාට ය.

37. දේවානම්පිය තිස්ස රජතුමා රාජ්‍යත්වයට පත් වූ විගස සමකාලීන භාරතීය අධිරාජයා වූ අශෝක රජතුමාට තුටු පඬුරු සහිත ව අරිට්ඨ කුමරු සමඟ දූත පිරිසක් පිටත් කර යැවූ බව මහාවංශයේ සඳහන් වේ. අරිට්ඨ කුමරු හමුවීමෙන් බොහෝ සතුටට පත් අශෝක රජු රාජ්‍යාභිෂේකයට අවශ්‍ය සියලු දේ තිස්ස රජු වෙත එවීමට ද, ඒ සමඟ ම හසුනක් මගින් සුවිශේෂී පණිවිඩයක් එවීමට ද අමතක නො කළේ ය. එම සුවිශේෂ පණිවිඩය වූයේ,

(1) ඉතා ඉක්මනින් සිය පුත් මිහිඳු හිමියන් දහම් පණිවිඩය රැගෙන ශ්‍රී ලංකාවට පැමිණෙන බව ය.
(2) සිය දියණිය සංඝමිත් තෙරණිය අත ශ්‍රී මහබෝධි ශාඛාව ශ්‍රී ලංකාවට වැඩම කරන බව ය.
(3) තමා තෙරුවන් සරණ ගොස් ඇති බැවින් තිස්ස රජුට ද තෙරුවන් සරණගිය උපාසකයකු වන ලෙස දැන්වීම ය.
(4) තමා විසින් එවන ලද කකුධ භාණ්ඩ නො පැළඳ රාජ්‍යාභිෂේකය නො කරන ලෙස ය.
(5) මිහිඳු හිමියන් පැමිණෙන තෙක් ශ්‍රී ලංකාවේ බුදුසමය ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සූදානම් කර තබන ලෙස ය.

38. බුදුරජාණන් වහන්සේ තෙවනවර ලක්දිවට වැඩම කොට සමවත් සුවයෙන් වැඩ සිටි ස්ථානයක මිහිඳු හිමියන්ගේ උපදෙස් පරිදි දේවානම්පිය තිස්ස රජු විසින් ථූපාරාම දාගැබ ඉදි කරන ලද්'යි මහාවංශාදී මූලාශ්‍රයවල සඳහන් වේ. එම මූලාශ්‍රයන්ට අනුව මෙම ස්තූපයේ නිදන් කොට ඇතැයි සලකනු ලබන්නේ බුදුරජාණන් වහන්සේගේ,

(1) පාත්‍රා ධාතුවයි. (2) ග්‍රීවා ධාතුවයි. (3) දකුණු අකු ධාතුවයි.
(4) ලලාට ධාතුවයි. (5) දකුණු දළදාවයි.

39. මහා විහාරය ශ්‍රී ලංකාවේ ප්‍රථම ථෙරවාදී බෞද්ධ මධ්‍යස්ථානය විය. එහි කාර්යභාරය විවිධ ක්ෂේත්‍ර කරා විහිදී ගොස් ඇති බව ඓතිහාසික තොරතුරු තහවුරු කරයි. ඒ අනුව ථෙරවාදී බුදුසමයේ අනන්‍යතාව තහවුරු කිරීම් වස් මහාවිහාරය ඉටුකළ ප්‍රමුඛ කාර්යයක් ලෙස සැලකිය හැක්කේ,

(1) වෛතුල්‍යවාදය ප්‍රතික්ෂේප කිරීම ය. (2) අභයගිරි භික්ෂූන්ගේ මතවාද නො පිළිගැනීම ය.
(3) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ය. (4) අටුවා ග්‍රන්ථ සම්පාදනය කිරීම ය.
(5) විනය සංගීතියක් පැවැත්වීම ය.

40. 1871 දී බුරුමයේ මණ්ඩලේ නුවර දී භික්ෂූන් වහන්සේලා දෙදහස් දෙසිය නමකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද සංගායනාව පස්වන ථෙරවාදී සංගායනාව ලෙස සලකනු ලැබේ. මෙම සංගායනාවෙන් පසු කිරිගරුඬ ලැලි හත්සිය විසිහයක ත්‍රිපිටකය ලියවා තැන්පත් කරන ලදී. මේ සඳහා රාජානුග්‍රහය සපයන ලද්දේ,

(1) මින් ඩොන් මින් රජතුමා ය. (2) ක්‍යෙංසිත්ථ රජතුමා ය. (3) අනවරථ රජතුමා ය.
(4) ධම්මචේතිය රජතුමා ය. (5) බෝදෞපයා රජතුමා ය.

41. ක්‍රි.ව. හත් වන සියවසේ ද්වාරවතී රාජ්‍යයේ බුදුසමය සමෘද්ධිමත්ව පැවැතියේ යැ'යි හියුං සියැං හිමිගේ දේශාටන වාර්තාවේ දක් වේ. මේ අනුව ඒ යුගයේ බුදුසමය සමෘද්ධිමත්ව පැවැති ඇත්තේ,

(1) බුරුමයේ ය. (2) තායිලන්තයේ ය. (3) භාරතයේ ය.
(4) ඇෆ්ගනිස්ථානයේ ය. (5) චීනයේ ය.

42. බෞද්ධ ධර්ම ග්‍රන්ථ සංස්කරණයෙහි ලා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකළ රටක් ලෙස චීනය හඳුන්වාදිය හැකි ය. භාරතීය හා මධ්‍යාසියාතික පැවිදි පඬිවරුන් මෙන් ම චීන ජාතික භික්ෂූහු ද ධර්ම විනය ග්‍රන්ථ දහස් ගණනක් පිටපත් කර චීනයට ගෙන ගොස් චීන බසට නගා අධ්‍යාපනය, පර්යේෂණය, සංරක්ෂණය මෙන් ම ප්‍රායෝගික භාවිතයට ද යොමු කළහ. මෙම ධර්මග්‍රන්ථ විශාල ප්‍රමාණයක් චීන බසට නගමින් පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ පඬිවරයකු වන්නේ,

(1) කාශ්‍යප මාතංග හිමියන් ය. (2) ධර්මරක්ෂ හිමියන් ය. (3) බෝධිධර්ම හිමියන් ය.
(4) නාගාර්ජුන හිමියන් ය. (5) කුමාරජීව හිමියන් ය.

43. ජපන් ජාතිකයෝ ප්‍රතිනිර්මාණ ක්ෂේත්‍රයෙහි සුවිශේෂී දක්ෂතා ප්‍රකට කරති. බුදු දහම හඳුන්වාදීමෙන් අනතුරුව මහායාන බුදු දහමේ මූලික හරය චීනයෙන් ලබාගත් ජපන්නු තම රටේ සිතුම් පැතුම්, ජන ජීවිතය හා දේශගුණික තත්ත්වයන්ට සරිලන සේ එය ප්‍රතිනිර්මාණය කළෝ ය. ඒ අනුව ජපානය තුළ විවිධ ආගමික හා දාර්ශනික පිළිගැනීම් සහිත ව බෞද්ධ නිකාය සංවර්ධනය විය. නිචිරෙන් හිමියන් විසින් හඳුන්වා දෙන ලද නිචිරෙන් නිකාය ද එවැනි එක් නිකායක් වන අතර **"නම්යෝ හෝරෙන්ගෙක්යෝ"** යන පාඨය ගායනා කරමින් මහායාන සූත්‍රයකට නමස්කාර කිරීම එහි ප්‍රමුඛ ඉගැන්වීමයි. මෙසේ වන්දනාමානයට ලක්වන මහායාන සූත්‍රය වනුයේ,

(1) අෂ්ටසාහස්‍රිකාප්‍රඥාපාරමිතා සූත්‍රයයි.
(2) සුඛාවතීව්‍යූහ සූත්‍රයයි.
(3) ලංකාවතාර සූත්‍රයයි.
(4) සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයයි.
(5) විමලකීර්ති නිර්දේශ සූත්‍රයයි.

44. ජපානය තුළ මහායාන බුදුසමය ජනකාන්ත ඇදහිල්ලක් බවට පත් කිරීමේ දී සියලු පැතුම් සපුරාලන **'නෙම්බුත්සු'** නම් අමිතාභ වන්දනාව හඳුන්වා දෙමින්, ජපන් බුදු දහම නව මාවතකට යොමු කිරීමට පුරෝගාමීව කටයුතු කරන ලද්දේ,

(1) ෂෝතොකු තයිෂි විසිනි.
(2) ෂින්රන් විසිනි.
(3) හෝනෙන් ෂෝනින් විසිනි.
(4) සයිචෝ විසිනි.
(5) කුකයි විසිනි.

45. බුදුරජාණන් වහන්සේ පළමුවරට මානව රූපාකාරයෙන් නිර්මාණය කරන ලද්දේ ක්‍රි.පූ. 1 වන සියවසේ දී හෝ ක්‍රි.ව. 1 වන සියවසේ දී යැයි පිළි ගැනේ. එසේ වුවත් මෙයට සියවස් කිහිපයකට පෙර ශ්‍රී ලංකාවේ දී බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කරන ලදැයි මහාවංශයේ සඳහන් වේ. එම ප්‍රතිමාව ලෙස සලකනු ලබන්නේ,

(1) සමාධි ප්‍රතිමාවයි.
(2) තොලුවිල ප්‍රතිමාවයි.
(3) උරුසිලා ප්‍රතිමාවයි.
(4) අවුකන ප්‍රතිමාවයි.
(5) මහ ඉලුක්පල්ලම ප්‍රතිමාවයි.

46. සඳකඩ පහණ වනාහි හෙළ කලාකරුවන්ගේ අද්වීන කලා නිපුණතාව පිළිබිඹු කරන අපූරු නිර්මාණයකි. එහි අන්තර්ගත කලාංග හුදෙක් අලංකරණය සඳහා පමණක් නොව වැදගත් අර්ථ දැනවීම සඳහා බව විචාරකයන්ගේ අදහසයි. ඒ අනුව එච්.සී.පී. බෙල් මහතා ප්‍රකාශ කළේ සඳකඩ පහණින්,

(1) සතර දිශාව සංකේතවත් වන බවයි.
(2) භව චක්‍රය සංකේතවත් වන බවයි.
(3) සිවුදිසා වැයි සංසාරත්තය සංකේතවත් වන බවයි.
(4) මංගල සම්මත වස්තු සංකේතවත් වන බවයි.
(5) ඉරහඳ සංකේතවත් වන බවයි.

47. ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණය සඳහා භාරතීය ස්තූපවල ආභාසය ලැබුණ ද, පශ්චාද් කාලීන ව පේසාවළලු, කොත්කැරැල්ල කොත යනාදී නව අංග සමුදායක් ලක්දිව ස්තූපයට එක් වී තිබේ. ඒ අනුව, ඉන්දියානු දාගැබ්වල දක්නට නොමැති ලංකාවේ දාගැබ්වල පමණක් දැකිය හැකි, සිවු දිගට මුහුණ ලා ඉදිකළ නව අංගය වන්නේ,

(1) සඳකඩ පහණයි.
(2) මුරගලයි.
(3) කොරවක් ගලයි.
(4) වාහල්කඩයි.
(5) පියගැටපෙළයි.

48. බෞද්ධ පූජනීය වස්තු සංරක්ෂණය කරලීම සඳහා පටිමාඝර, බෝධිඝර, ථූපඝර යනාදි වශයෙන් හඳුන්වනු ලබන ගොඩනැගිලි විශේෂ ඉදි විය. අටදාගේ ද එවැනි එක් ගොඩනැගිල්ලකි. ඒ අනුව අටදාගේ යනු,

(1) බුද්ධප්‍රතිමා සඳහා ඉදි කළ ගෘහයකි.
(2) බෝධිය සඳහා ඉදි කළ ගෘහයකි.
(3) දළදා වහන්සේ සඳහා ඉදි කළ ගෘහයකි.
(4) ස්තූපය සඳහා ඉදි කළ ගෘහයකි.
(5) බෞද්ධ ග්‍රන්ථ සඳහා ඉදි කළ ගෘහයකි.

49. බුදුසමයෙන්, සිංහල සාහිත්‍යය ලද පෝෂණය කෙතෙක් ද යන්න පැරණි සිංහල සාහිත්‍යය තුළ බෞද්ධ තේමාවකින් තොර ව රචනා කරන ලද කෘතියක් සොයා ගැනීමට පවා නොහැකි වීමෙන් පැහැදිලි වේ. බුදුගුණ හා විවිධ බෞද්ධ තේමා මුල් කර ගෙන රචිත විශාල ප්‍රමාණයක් වූ සිංහල සාහිත්‍ය කෘති අතර විද්‍යාචක්‍රවර්තීන්ගේ බුත්සරණ ග්‍රන්ථයෙහි තේමාව වූයේ බුදුරජාණන් වහන්සේගේ,

(1) සුගත ගුණයයි.
(2) සත්‍ථා ගුණයයි.
(3) පුරිස දම්මසාරථී ගුණයයි.
(4) සම්මා සම්බුද්ධ ගුණයයි.
(5) ලෝකවිදූ ගුණයයි.

50. දිඹුලාගල විහාරය හෙවත් උදුම්බරගිරි විහාරය ආරණ්‍ය සේනාසනයක් පමණක් නොව පොළොන්නරු යුගයට අයත් බෞද්ධ කලා නිර්මාණ පිළිබඳ ප්‍රකට ස්ථානයක් වශයෙන් ද හඳුනාගෙන ඇත. ඒ අනුව එම විහාරය ප්‍රකට වූයේ,

(1) බෞද්ධ සිතුවම් කලාව සඳහා ය.
(2) බුද්ධ ප්‍රතිමා කලාව සඳහා ය.
(3) බෞද්ධ මූර්ති කලාව සඳහා ය.
(4) බෞද්ධ කැටයම් කලාව සඳහා ය.
(5) බෞද්ධ ස්තූප කලාව සඳහා ය.

*****

EXAMMOOD.LK

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු (නව නිර්දේශය)
**General Certificate of Education (Adv. Level) Examination, August 2014 (New Syllabus)**

**බෞද්ධ ශිෂ්ටාචාරය II / පැය තුනයි**
**Buddhist Civilization II / Three hours**

**උපදෙස්:**
* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **දෙකක් පමණක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

01. (i) බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.
(ii) බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ප්‍රකට වන අවස්ථා **දෙකක්** සංක්ෂේපයෙන් ගෙනහැර දක්වන්න.
(iii) බුදුරජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය පැහැදිලි වන අවස්ථා **දෙකක්** පෙන්වා දෙන්න.
(iv) බුදුරජාණන් වහන්සේ "තිලෝගුරු" යනුවෙන් හැඳින්වෙන්නේ කවර හෙයින් දැ'යි සැකෙවින් දක්වන්න.
(v) උපමානුසාරයෙන් දහම් දෙසීමෙහි ලා බුදුරදුන් තුළ පැවැති ශක්‍යතාව උදාහරණ **දෙකක්** මගින් පැහැදිලි කරන්න.

02. (i) බුද්ධකාලීන භාරතයේ විසූ විවිධ ශ්‍රමණ කණ්ඩායම් පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.
(ii) බ්‍රාහ්මණ පූජක පන්තියට අදාළ විශේෂ ලක්ෂණ ගෙනහැර දක්වන්න.
(iii) බෞද්ධ පැවිදි සංවිධානයේ ප්‍රභවය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(iv) සාමණේර පැවිද්ද හා උපසම්පදාව අතර වෙනස පැහැදිලි කරන්න.
(v) "ඤත්ති චතුත්ථ කම්ම" උපසම්පදාව කෙටියෙන් හඳුන්වන්න.

03. (i) උට්ඨාන සම්පදාව ධර්මානුකූල ව විවරණය කරන්න.
(ii) "භෝග සුඛය" හඳුන්වා දෙන්න.
(iii) "භෝග විනාශ මුඛ" කවරේ දැ'යි සැකෙවින් දක්වන්න.
(iv) මිත්‍ර ප්‍රතිරූපකයන් සහ සුහද මිතුරන් කෙටියෙන් හඳුන්වන්න.
(v) මාපිය දූදරු යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව ගෙනහැර දක්වන්න.

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න **තුනක් පමණක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.)

04. (i) බුද්ධකාලීන භාරතීය දේශපාලන ව්‍යුහය සකස් වී තිබූ ආකාරය ඓතිහාසික නයින් විමර්ශනය කරන්න.
(ii) ක්‍රි.පූ. 6 වන සියවස වන විට භාරතීය සමාජය වාණිජකරණයට ලක්වෙමින් පැවැතියේ දැ'යි බෞද්ධ මූලාශ්‍රයානුසාරයෙන් ගවේෂණය කරන්න.
(iii) පකුධ කච්චායනගේ ඉගැන්වීම් ගෙනහැර දක්වා, ඒවා බෞද්ධ ඉගැන්වීම් අනුව විචාරයට ලක්කරන්න.
(iv) කාන්තාවගේ අභිමානය සුරැකීමෙහි ලා බුදුසමයෙන් ලැබුණු දායකත්වය ප්‍රමාණ කරන්න.

05. (i) බෞද්ධ දේශපාලන මූලධර්ම සමාජ ශුභසාධනය අරමුණුකොට සකස් වී ඇති අයුරු පරීක්ෂා කරන්න.
(ii) "සදාචාරවත් සමාජයක් බිහිකර ගැනීමෙහි ලා නීති ගරුක වීම මෙන් ම පුද්ගලයාගේ ආධ්‍යාත්මික ශික්ෂණය ද එක සේ බලපායි." බෞද්ධ ඉගැන්වීම් අනුව පැහැදිලි කරන්න.
(iii) හොඳ-නරක විනිශ්චය පිළිබඳ බෞද්ධ නිර්ණායක සර්වකාලීන වටිනාකමකින් යුක්ත වන අයුරු පෙන්වා දෙන්න.
(iv) තරඟකාරීත්වය නිසා ඇතිවන මානසික ව්‍යාකූලතා ජය ගැනීමෙහි ලා බෞද්ධ ඉගැන්වීම්වලින් ලැබිය හැකි පිටිවහල ප්‍රමාණ කරන්න.

EXAMMOOD.LK

06. (i) සම්පත් කළමනාකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් නූතන ආර්ථික ගැටලු අවම කර ගැනීමෙහි ලා උපයෝගී කොට ගත හැකි ආකාරය පරීක්ෂා කරන්න.
(ii) කලා රසවින්දනය ප්‍රබුද්ධ හා සංවේදී මිනිසකු සතු උසස් ගුණාංගයක් බව සෞන්දර්ය රසාස්වාදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න.
(iii) අතීතයේ පටන් ශ්‍රී ලාංකික ජනසමාජයට ධාර්මික විනෝදාස්වාදය සැපයූ බෞද්ධ සංස්කෘතිකාංග පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.
(iv) ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සහජීවනයට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

07. (i) ද්විතීය ධර්ම සංගීතිය ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරන්නේ කවර හෙයින් දැ'යි පරීක්ෂා කරන්න.
(ii) මහින්දාගමනය ඓතිහාසික සංසිද්ධියක් ලෙස පිළිගැනීමට ප්‍රමාණවත් හේතු සාධක ඉදිරිපත් කරන්න.
(iii) අභයගිරි සම්ප්‍රදායයේ ප්‍රභවය ශ්‍රී ලාංකික ආගමික හා දේශපාලන ඉතිහාසය තුළ ව්‍යාකූලත්වයක් නිර්මාණය වීමෙහි ලා පාදක වූ අයුරු ඓතිහාසික නයින් විමසීමට ලක් කරන්න.
(iv) චීනයට බුදුසමය හඳුන්වා දීම පිළිබඳ ඓතිහාසික පසුබිම කෙටියෙන් දක්වා, එරට බුදුසමයේ පෝෂණයට ඉන්දු-චීන සංචාරක භික්ෂූන්ගෙන් සිදු වූ මෙහෙය ප්‍රමාණ කරන්න.

08. (i) මථුරා බුද්ධ ප්‍රතිමා කලාවේ ප්‍රභවය කෙරෙහි බල පෑ ඓතිහාසික පසුබිම පැහැදිලි කොට, මථුරා බුද්ධ ප්‍රතිමාවල සුවිශේෂතා ප්‍රකට කරන්න.
(ii) "පටිමා ඝරය" හා තදනුබද්ධ කලා නිර්මාණවල ශ්‍රී ලාංකේය අනන්‍යතාව ප්‍රකට වන්නේ දැ'යි විමර්ශනය කරන්න.
(iii) ජන හදවත් තුළට බෞද්ධ සාර ධර්ම නිරායාසයෙන් සම්ප්‍රේෂණය කිරීමෙහි ලා නාට්‍ය කලා මාධ්‍යය කෙතෙක් දුරට සමත් වී දැ'යි නිදසුන් මගින් ප්‍රකට කරන්න.
(iv) ජනකවි සම්ප්‍රදායයෙහි පෝෂණයට බුදුසමයෙන් ලැබුණු ආභාසය උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.

*****

EXAMMOOD.LK
EXAMMOOD.LK